# පුරාණ ග්‍රීක මැටි බඳුන් තුළින් හෙළිවන සම්භාව්‍ය ග්‍රීක සමාජය

ඩී. එස්. ඒ. මුණසිංහ*

ශිෂ්ටාචාරවත් මිනිසාගේ ඉතිහාසය තුළ ග්‍රීක සංස්කෘතියට හිමි වනුයේ අද්විතීය ස්ථානයකි. එම පුරාතන ග්‍රීක සංස්කෘතිය හෙලිදරව් කරන්නා වූ සුවිශේෂී මානව කෘතීන් සමුදායක් ලෙස මැටි බඳුන් පෙන්වා දිය හැකිය. මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ පුරාණ ග්‍රීක මැටි බඳුන් තුළින් හෙළිවන සම්භාව්‍ය ග්‍රීක සමාජය පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමයිග

මැටි බඳුන් වනාහි පුරාවිද්‍යා විෂය පථය තුළ ස්ථානීය වශයෙන් අතිශය වැදගත් මානව අතිතය හෙළිදරව් කරන්නා වූ සංස්කෘතික ප්‍රකාශකයකු වශයෙන් හඳුනාගත හැකියග පුරාතන ග්‍රීකයන් මෙම මැටි බඳුන් නිර්මාණය කෙරෙහි දක්වා ඇති සැලකිල්ල සුළුපටු නොවේ. ඔවුන් කාලවර්ණ, රක්තවර්ණ, ශ්වෙතවර්ණ ආදි ක්‍රමවේදයන් යොදා ගනිමින් සමකාලීන සමාජය තුළ පැවති මිත්‍යා කතා, වන්දනා ක්‍රම සමාජ සිදුවීම් පාදක කර ගනිමින් මැටි බඳුන් නිර්මාණය කරන ලදී. ලෝක ශිෂ්ටාචාරයට කලාව, දර්ශනය, සාහිත්‍යය, විචාරය, වෛද්‍ය ක්‍රමය, තර්කනය හා විද්‍යාව ආදි විෂයයන් රාශියක් දායාද කළ ප්‍රජාවකගේ සාමාජීය හැසිරීම් කවරාකාර වූයේ ද යන්න මෙහිලා හඳුනාගත හැකියග

ප්‍රමුඛ පද - ග්‍රීසිය, මැටි බඳුන්, සමාජය, පුරාවිද්‍යාව, සංස්කෘතිය

* පුරාවිද්‍යා අධ්‍යයනාංශයග කැළණිය විශ්ව විද්‍යාලය anuzone92@gmail.com